## “සංචාරයක අරමුණවන්නේ අනුන්ගේ කුණු කසල වල දුර්ගන්ධය ආශ්වාස කිරීමද ?” ලිපියට පිළිතුරක්....

ලිවීම කලාවකි. විවේචනය, එහි ගුණ දොස් සෙවීමකි. විවේචනය සිදුවන්නේ, එකම සිද්ධියක් දකින, මිනිසුන්ගේ දෘෂ්ඨිණයේ වෙනස නිසාවෙනි.

1988 දී සල්මාන් රෂීඩ් නැමැති ගත්කරුවා, ‘The Satanic Verses’ නමින් ග්‍රන්ථයක් පළ කලේය. වසරක් පාසා, හොඳම නවකාථාවට පිරිනැමෙන, Booker Prize නැමැති ත්‍යාගය සඳහා අවසාන වටයටද තේරුණ මෙම ග්‍රන්ථය, බටහිර ලෝකය ඉහළින් පිළිගත් මුත්, මුස්ලිම් ජාතීන් අතර, මහත් ආන්දෝලනයක් ඇති කළේය. බොහෝ රටවල මෙම ග්‍රන්ථය, තහනම් කරනු ලැබූ අතර, සමහර රටවල එය ඉරා, ගිනිබත් කරනු ලැබීය. එවකට ඉරානය පාලනය කළ අයතුල්ලා කුමේනි විසින්, රෂ්ඩිව මරණ දණ්ඩනයට නියම කෙරිණි. මේ නිසා සෑහෙන කාලයක්, බ්‍රිතාන්‍ය ආණ්ඩුවේ රක්‍ෂාවරණය යටතේ සැඟවී සිටීමට ඔහුට සිදුවූයේය. එමෙන්ම එම කාලය තුල සිදුවූ කලකෝලහල වලින්, රෂ්ඩිගේ ග්‍රන්ථය, විවිධ භාෂාවලට පරිවර්තනය කරනු ලැබූ අතර, තවත් කිහිපදෙනෙකු මරා දමනු ලැබූ අතර, තවත් කිහිපදෙනෙකු වෙනත් අතවරවලට ලක්වූවෝය. මෙය සිදුවූයේ, එකම කථාවක්, මිනිසුන් ගණනාවක් විවිධ ඇසින් බැලීම නිසාය.

අද අප ජීවත්වන්නේ, පුද්ගලික නිදහස, උපරිම තත්තවයක පවතින කාලයකය. කථාව, ලිවීම, විවේචනය මෙන්ම ඕන මූ පැටියකට ජීවිත්වීමටද, අපට සම්පූර්ණ නිදහසක් ඇත්තේ ය. මෑතදී, ඇමරිකානු එක්සත් ජනපදයේ, ජනාධිපති ලෙස තේරී පත්වූ බරක් ඔබාමාට විරුද්ධව මාස ගණනාවක් තිස්සේ, දවසේ පැය විසිහතර තුළ, රූපවාහිනී මාධ්‍යක් මගින් පහර වැදුණේ ඒ නිදහස නිසාමය.

මේ නිසා, කුමන අන්දමේ වුවද, විවේචනයක වරදක් නොදකින්නෙමි. මගේ මේ ලිපියෙහි අරමුණවන්නේ, නොවැම්බර් මස ‘සන්නස’ සඟරාවෙහි පල වූ, ‘සංචාරයක අරමුණවන්නේ අනුන්ගේ කුණුකසලවල දුර්ගන්ධය ආශ්වාස කිරීමද ?’ යන ලිපියට පිළිතුරු සැපයීමය. ඒ හැර පහත් ලිපිවල හෝ අන්තර්ජාලය ඔස්සේ මට ලැබෙන තර්ජනාත්මක, විද්‍යුත් ලිපිවලට පිළිතුරු සැපයීමට බලාපොරොත්තු නොවන්නෙමි.

මා මුලින් පැවසිය යුත්තේ, අප රට රටවල සංචාරය කරන්නේ, අනුන්ගේ කුණු කසල ඇවිස්සීම සඳහා නොවන බවය. අපි බර්ලිනයේ සති දෙකක් ගත කළෙමු. මේ කාලය තුළ, විවිධ පුද්ගලයන් ගණනාවක් මුණගැසුණි. මා, මගේ ලිපියෙහි සඳහන් කළේ, ඉන් එක් කොටසක් ගැන පමණි.




බර්ලිනයෙන් පසු, මාත් මගේ සැමියාත්, කීනියාවේත්, (KENYA) මෙක්සිකෝවේත්, සංචාරය කළෙමු. මා විසින් ලියන ලද කීනියාවේදි මුණගැසුණු ‘මසායි MASAI ගෝත්‍රික ගැහැණුන්’ ගැනත්, මෙක්සිකෝවේදී (MEXICO) මුණගැසුණු ‘ඉන්දියානු ගැහැණුන්’ ගැනත් ලිපි දෙකක්, ඔක්තෝබර් සහ නොවැම්බර් ‘පහන’ කලාපවල පලවිය. ඒවායේ සඳහන් වෙන්නේ, පවුල්බර ගෙනයාම සඳහා තම සැමියන්ට ආධාර කරනු වස් විසිතුරු ආභරණ තනන, වර්ණවත් රෙදිපිළි වියන, නොදියුණු ගෝත්‍රික ගැහැණුන් පිළිබඳවය. පිරිමින් හා උරිනුර ගැටෙමින්, ඔවුන් ගෙවනා දිවිසටන ගැනය.

මා, වනිතාවන් ගැන ලියන්නේ, අවුරුදු ගණනාවක සිටය. අදටත් අපේ ශ්‍රී ලාංකික සමාජයේ, වපර ඇසට හසුවන කාන්තා චරිත කිහිපයක් පිළිබඳවද, ලිපි කිහිපයක් මා විසින් පලකරනු ලැබ ඇත. මින් එක් ගැහැණියක, තම සැමියාගෙන් බැට කා ඉතා අපහසුවෙන් දිවි ගලවා ගත් අයෙකු වූ අතර, අනෙක් ගැහැණිය, දික්කසාදය නිසා, සමාජයෙන් බැට කෑ කාන්තාවක වූවාය. අනෙකුත් ගැහැණුන් පිළිබඳව, මා නොතකනවා නම් මා මේ ලිපි ලීවේ ඇයිදැයි යන්න ප්‍රශ්නයක් වනවා නොඅනුමානය.

ශ්‍රී ලංකාවේ දුක් විඳිනා ගැහැණුන් ගැන, මමද ගැහැණියක ලෙස දුක් වෙමි. ඔවුන් කුමන ජාතිකයකු සමඟ හෝ වේවා, කුමන අන්දමකින් හෝ වේවා විවාහ වී, සතුටින් දිවි ගෙවනවා නම්, මම සතුටු වෙමි. මා මාගේ ලිපියෙන් අදහස් දැක්වූයේ, ‘විවාහය’ යන සංකල්පය පිළබඳව, බර්ලිනයේ ‘එක් ගැහැණු කොටසක්’ තුළ දක්නට ඇති ආකල්පයත් සමගින් බර්ලිනයේ වෙසෙනා, එක් පිරිමි කොටසකට සිදුවන අසාධාරණයත් පිළිබඳවය. ‘බර්ලිනයේදී මා දුටු සමහර ශ්‍රී ලාංකික ගැහැණු.....’ ලෙස මගේ ලිපියේ මාතෘකාව වෙන්ස් විය යුතුව තිබුණේ, මා විසින් විස්තර කිරීමට යෙදුණේ, බර්ලිනයේ සියලුම කාන්තාවන් නොවන නිසාවෙනි. මාගේ අතපසුවීමක් නිසා, බර්ලීනයේ ජීවත්වන සෙසු කාන්තාවන් හට සිත් තැවුලක් ඇති වූයේ නම්, ඒ පිළිබඳව අවංකවම කණගාටුවෙමි.

රට රටවල සංචාරය කිරීමේදී අහම්බෙන් හෝ කුණුකසල හමු වූ විට, ඉන් නැගෙන දුර්ගන්ධය, අකමැත්තෙන් හෝ අපට අනිවාර්යයෙන්ම ආශ්වාස කිරීමට සිදුවන්නේය. කෙතරම් විශාල ගොඩනැගිලි තිබුණද, එහි වැසියන් කොපමණ අලංකාරව සැරසුනද, නගරයක් වටා ඇති කුණු කසළ ඉවත් කරනාතුරු, එහි නියම අලංකාරයක් දැකගත නොහැක්කේය. කෙදිනක හෝ මෙම කුණු ගොඩවල් ඉවත් කිරීම සඳහා නව ජනකායක් පහළවනු ඇත. මෙය කිසිවකුට නතර කළ නොහැක්කකි.

මාගේ ලිපියෙන්, කාන්තාවන් දෙතුන්දෙනෙකු ඉමහත් කෝපයකට පැමිණ ඇති බව පැහැදිලිව පෙනෙන්නේය. ඔවුන් මා විසින් විස්තර කරන ලද කාන්තාවන් ගොඩට වැටෙනවාද නැත්නම් අනිකුත් කාන්තාවන් වෙනුවෙන් සටන් කරනවාදැයි යන්න ප්‍රශ්නයකි.

අවසාන වශයෙන් කිවයුත්තේ, මා විසින් ලියන ලද්දේ වෙනත් කිසිවකුගෙන් ලැබුණු තොරතුරක් නොව, මෙම සංචාරයේදී මගේ නිරීක්ෂණයට හසු වූ අත්දැකීම් බවය.

**හේමමාලා හේරත්**

*කොලම්බියා, මිසූරිඇමරිකා එක්සත් ජනපදය*

# LIFE

A professor stood before his Philosophy class and had some items in front of him.

When the class began, wordlessly, he picked up a very large and empty mayonnaise jar and proceeded to fill it with golf balls.

He then asked the students if the jar was full.

They agreed that it was.

The professor then picked up a box of pebbles and poured them into the jar.

He shook the jar lightly. The pebbles rolled into the open areas between the golf balls.

He then asked the students again if the jar was full.

They agreed it was.

The professor next picked up a box of sand and poured it into the jar.

Of course, the sand filled up everything else.

He asked once more if the jar was full.

The students responded with a unanimous "yes."

The professor then produced two cups of coffee from under the table and poured the entire contents into the jar, effectively filling the empty space between the sand.

The students laughed.

"Now," said the professor, as the laughter subsided, "I want you to recognize that this jar represents your life.

"The golf balls are the important things - yur God, family, your children, your health, your friends, and your favorite passions - things that if everything else was lost and only they remained, your life would still be full.

"The pebbles are the other things that matter like your job, your house, and your car.

"The sand is everything else--the small stuff.

"If you put the sand into the jar first," he continued, "there is no room for the pebbles or the golf balls.

"The same goes for life.
"If you spend all your time and energy on the small stuff, you will never have room for the things that are important to you.

"Pay attention to the things that are critical to your happiness.

Play with your children.

"Take time to get medical checkups.

"Take your partner out to dinner.

"Play another 18.

"There will always be time to clean the house and fix the disposal.

"Take care of the golf balls first, the things that really matter.

"Set your priorities.

"The rest is just sand."

One of the students raised her hand and inquired what the coffee represented.

The professor smiled. "I'm glad you asked. "It just goes to show you that no matter how full your life may seem, there's always room for a cup of coffee with a friend."

Please share this with someone you care about.

